# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2020

## First Term Test - 2020

| 33 | S | I,II, III |
|---|---|---|

**ඉතිහාසය I, II, III**

**History I, II, III**

**කාලය පැය තුනයි.**

නම / අංකය : ..............................................................

**11 ශ්‍රේණිය**

### I කොටස

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. මෙරට සාසන ඉතිහාසය හැදෑරීමට ඇති වැදගත්ම කෘතියක් වන්නේ,
   i. සමන්තපාසාදිකාව ii. නිකාය සංග්‍රහය iii. සිංහල බෝධි වංශය iv. රාජාවලිය

2. පහත දැක්වෙන කෘති අතරින් පෘතුගීසි මූලාශ්‍රයට අයත් වන්නේ
   i. ප්ලීනිගේ නැචුලිස් හිස්ටෝරියා ii. මෙගස්තිනීස්ගේ ඉන්ඩිකා
   iii. රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය iv. පිලිපස් බැල්සියස්ගේ කෘතිය

3. X හා Y තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| X | | Y |
|---|---|---|
| එදාහෙළදිව | A. | ප්‍රශස්ති කාව්‍ය |
| ඩිමුණ්ඩෝ | B. | නිශ්ශංක මල්ල |
| ගල්පොත | C. | රොබට් නොක්ස් |
| පැරකුම්බා සිරිත | D. | පිලිප්පස් බැල්ඩියස් |
| | E. | ඇරිස්ටෝටල් |

   i. C E A B ii. C E A B iii. E C B A iv. C E B A

agaram.lk

4. දේශගුණික කලාප අනුව ශ්‍රී ලංකාව ප්‍රාග් ඓතිහාසික කලාප ගණන
   i. 7 යි ii. 6 යි iii. 8 යි iv. 4 යි

5. ලංකාවේ දැනට සොයාගෙන ඇති පැරණිතම ප්‍රාග් ඓතිහාසික සාධක සොයාගෙන ඇත්තේ,
   i. හම්බන්තොට පතිරාජවෙල ප්‍රදේශයෙනි ii. බූන්දල වැල්ලෙගංගොඩ ප්‍රදේශයෙනි
   iii. බුලත්සිංහල පාහියන්ගොඩ ප්‍රදේශයෙනි iv. රත්නපුර බටදොඹලෙන ප්‍රදේශයෙනි

6. වර්ග අඩි 120 ක වපසරියක් තුළ මිනිස් ඇටසැකිලි 30 කට අයත් නෂ්ටාවශේෂ සොයාගත්තේ,
   i. කිතුල්ගලින් ii. බෙල්ලන්බැඳි පැලැස්සෙන්
   iii. පාහියන්ගලෙන් iv. වැල්ලේගංගොඩ ප්‍රදේශයෙන්

7. රාවණා ඇල්ල, පාහියන්ගල හා බටදොඹලෙනින් සොයාගත් ප්‍රබල ප්‍රාග් ඓතිහාසික සාක්ෂි වන්නේ,
   i. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව ii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ නිවාස
   iii. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ තාක්ෂණය iv. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාරවිධි

8. කේවට්ටගාම යනුවෙන් අතීතයේ හඳුන්වා ඇත්තේ,
   i. ගොවියන් විසූ ගම ii. ධීවරයන් විසූ ගම
   iii. වඩුවන් විසූ ගම iv. ගොවියන් විසූ ගම

9. මාතලේ ඇඹල් ඇළේ සෙල් ලිපිය විස්තර කරන්නේ,

i. පරුමක වරුන්ගේ බලය වර්ධනය වීම  ii. වෙළඳපොලක පාලනය පිළිබඳව
iii. අතීත අධිකරණ කටයුතු පිළිබඳව  iv. භික්ෂූන් වහන්සේලාට ගල්ගුහා පූජා කිරීම

10. අතීත සෙල්ලිපිවල කාලිංග චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ ලෙස හඳුන්වන්නේ,

i. පළමු කාශ්‍යප රජු  ii. පළමු විජයබාහු රජු
iii. නිශ්ශංක මල්ල රජු  iv. කූටකන්න තිස්ස අභය රජු

11. අතීතයේ රූපදක ලෙස හඳුන්වන්නේ,

i. භෝජනශාලා අධිපති  ii. වෙළඳ කටයුතු භාර ප්‍රධානී
iii. කාසි අච්චු ගැසීමේ අංශයේ ප්‍රධානී  iv. වත්සිරිත් භාර නිලධාරී

12. පූර්ව රාජ්‍ය සමයේ වත්පොහොසත්කම මත කුඩා ප්‍රදේශයක් පාලනය කල තැනැත්තා හඳුන්වා ඇත්තේ,

i. ගමික  ii. දසගම් ඇත්තන්  iii. පරුමක  iv. ගෘහපති

13. A හා B තීරු නිවැරදිව ගලපන්න

| A | | B |
|---|---|---|
| 1. පොළොන්නරුව දළදා මාලිගයේ ආරක්ෂාවට වේලක්කාර හමුදාව පත් කිරීම | A. | වසභ රජු |
| 2. වීදුරු පබළු ගෙන ඒමට රෝමානු දේශයට දූතයන් යැවූ රජු | B. | පළමුවන ගජබාහු රජු |
| 3. වල්ලිපුරන් රන්පත රචනා කල කාලයේ විසූ රජු | C. | කනිට්ඨතිස්ස රජු |
| 4. පත්තිනි දේවාලය විවෘත කිරීමට ඉන්දියාවේ චෝර රාජ්‍යයට ගිය රජු | D. | බුද්ධදාස රජු |
| | E. | පළමු විජයබාහු රජු |

i. E C A B  ii. E C B A  iii. A E B C  iv. B C A E

14. නායක තෙරුන්වහන්සේලා සමීපයේ විසූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා හඳුන්වා ඇත්තේ,

i. ථෙර  ii. අන්තේවාසික  iii. සද්ධිවිහාරික  iv. භාණකවරු

agaram.lk

15. පුරාණ කාලයේ වියලි කලාපයේ ඉදිකරන ලද "උරාකැට ළිං" ලෙස හඳුන්වා ඇත්තේ,

i. කුඹුරු වලට ජලය ලබා ගැනීමට ඉදිකරන ලද ළිං
ii. මැටි බඳුන් මගින් ළිඳේ බිත්ති ආවරණය කරන ලද ළිං
iii. වගා ළිං
iv. භාවිතයෙන් ඉවත් කරන ලද ළිං

16. නමවන සියවසට අයත් සෙල්ලිපිවල "රද් කොල් සමදරු" යන යෙදුමෙන් අදහස් වන්නේ

i. රදලයන්ගේ ස්වාමියා යන්න  ii. රජු හා රදලයන් යන්න
iii. සීගිරි කුරුටු ගී  iv. රාජකීය නිලධාරීන්

17. 1 තීරුව 11 තීරුව සමග ගලපන්න

| *1 තීරුව* | | *11 තීරුව* |
|---|---|---|
| 1. කොණ්ඩවච්චාන් සෙල්ලිපිය | A. | හෝපිටිගමුව වෙළඳපොලෙහි පාලනය |
| 2. සිතුල්පව්ව සෙල් ලිපිය | B. | සීසෑම නිසි කලට නොකරන්නන්ට දඬ නියම කිරීම |
| 3. මිහින්තලා සෙල්ලිපිය | C. | මී හරකුන් එළහරකුන් ඝාතනය කරන්නන්ට මරණ දඬුවම |
| 4. සොරබොර වැව සෙල්ලිපිය | D. | නීති කඩකල අයට දඬුවම් පැනවීමට මහාධිකරණයක් පිහිටුවීම |

i. A B C D  ii. B D C A  iii. B D A C  iv. C D A B

18. පැරණි පොත්වල "කරබෙරිය " ලෙස හඳුන්වා ඇත්තේ,
   i. ගොරකා  ii. කරපිංචා  iii. අසමෝදගම්  iv. අබ

19. අතීතයේ "හවජර" යන පදය භාවිත කරන ලද්දේ,
   i. දිනය හා අදහස දැක්වීමට  ii. මාසයක කාලය දැක්වීමට
   iii. මාස දොළසක කාලය දැක්වීමට  iv. පසළොස්වක පෝය දිනය දැක්වීමට

20. I තීරුව II තීරුව සමග ගලපන්න

| *I තීරුව* | *II තීරුව* |
|---|---|
| 1. බොජක පති | A. වැව්වල ජලය භාවිතා කිරීම වෙනුවෙන් අයකල බද්ද |
| 2. මතරමජිබක | B. ඇල මාර්ග වල මත්ස්‍යයන් ඇල්ලීම වෙනුවෙන් අයකල බද්ද |
| 3. දකපති | C. රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් අයකල බද්ද |

   i. A B C  ii. B C A  iii. B A C  iv. C B A

21. ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ කෙරෙහි අග්නිදිග ආසියාතික රටවල බලපෑම් ඇතිවූ බවට නිදසුන් වන්නේ,
   i. පොළොන්නරු ගල් විහාරය හා සත්මහල් ප්‍රාසාදය  ii. සමාධි ප්‍රතිමාව
   iii. රන්මසු උයනේ පොකුණු  iv. පොළොන්නරු කිරි වෙහෙර හා වටදාගෙය

22. පලමුවන බුවනෙකබාහු රජු වෙළඳ සබඳතා ඇතිකර ගැනීමට තානාපතිවරුන් යැවූ රට වන්නේ,
   i. අරාබිය  ii. කාම්බෝජය  iii. ඊජිප්තුව  iv. ඉන්දියාව

23. කෝට්ටේ බලකොටුවක් ඉදිකර යාපනය පාලනය කළ ආර්ය චක්‍රවර්තීන්ගේ බලය දුර්වල කළ සෙන්පතියා,
   i. නිශ්ශංක අලකේෂ්වර  ii. සේනාධිලංකාර  iii. සුභ සෙනෙවි  iv. දේවපතිරාජ ඇමති

*A - කව්සිළුමිණ*  *B - පන්සිය පනස් ජාතකය*  *C - සද්ධර්මාලංකාරය*
*D - පැරකුම්බා සිරිත*  *E - සද්ධර්මරත්නාවලිය*  *F - බුදුගුණ අලංකාරය*
*G - මයුර සංදේශය*  *H - සසදාවත*  *I - දළදා පිරිත*

24. දඹදෙණි යුගයට අයත් ග්‍රන්ථ ඇතුළත් පිලිතුර වන්නේ,
   i. A E  ii. A D  iii. H I  iv. B C

25. කුරුණෑගල යුගයේ රචිත ග්‍රන්ථ වන්නේ,
   i. B H  ii. D E  iii. C F  iv. B I

26. ගම්පොල යුගයට අයත් ග්‍රන්ථ වන්නේ,
   i. C D  ii. C G  iii. G H  iv. B F

27. කෝට්ටේ යුගයේ රචිත ග්‍රන්ථ වන්නේ,
   i. B C  ii. D H  iii. D F  iv. H I

28. A තීරුව B තීරුව සමග ගලපන්න

| ***A*** | ***B*** |
|---|---|
| 1. ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු | A. නායක්කාර පළමු රජු |
| 2. දෙවන විමලධර්මසූරිය රජු | B. ලන්දේසීන් පලවා හැරීමට ඉංග්‍රීසීන්ගේ සහාය පැතූ රජු |
| 3. ශ්‍රී විජයරාජසිංහ රජු | C. සිංහල රාජවංශයේ අවසාන රජු |
| 4. කීර්ති ශ්‍රී රාජසිංහ රජු | D. බුරුමයෙන් උපසම්පදාව ගෙනආ රජු |

   i. C D A B  ii. C B D A  iii. B A D C  iv. D A B C



agaram.lk

29. ජෝන් වයික්ලිප්, ඉරාස්මස්, මාටින් ලූතර් යන අය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වගන්තිය වන්නේ,
   i. පුනරුද සමයේ බිහිවූ ගත්කතුවරුය
   ii. විද්‍යාත්මක සොයාගැනීම් කල පුද්ගලයන්ය
   iii. දේශගවේෂන වලට නායකත්වය දුන් අය
   iv. කතෝලික සභාවේ දුර්වලතා විවේචනය කළ ආගමික පුනරුදයට දායක වූ අය

30. පුනරුද කලාශිල්ප වල දැකිය හැකි පොදු උත්තමාචාරයකි

   i. ලෞකික රසාස්වාදයට මුල් තැන දීම
   ii. කලා ශිල්ප ආගමික වීම
   iii. සියළු ශිල්පීන් ශ්‍රේණි ලෙස සංවිධානය වීම
   iv. කලා නිර්මාණ වලට පල්ලිය අනුග්‍රහය දැක්වීම

| | *රජතුමා* | | *ස්ථානය* | | *හමුදා නායක* |
|---|---|---|---|---|---|
| A. | *I විමලධර්මසූරිය රජු* | E. | *රන්දෙනිවල* | I. | *පේරෝ ලෝපේස් ද සූසා* |
| B. | *සෙනරත් රජු* | F. | *ගන්නොරුව* | J. | *කොන්ස්තන්තීනු ද සා* |
| C. | *පළමු රාජසිංහ රජු* | G. | *මුල්ලේරියාව* | K. | *දියෝගෝද මෙලෝ* |
| D. | *දෙවන රාජසිංහ රජු* | H. | *දන්තුරේ* | L. | *ජෙරනිමෝ ද අසවේදු* |

31. පළමු විමලධර්මසූරිය රජු පෘතුගීසීන් සමග සටන් කළ ස්ථානය හා පෘතුගීසි සෙන්පතියා
   i. H I   ii. E K   iii. H J   iv. G L

32. ඉහත සටන් අතුරින් දන්තුරේ සටනට අදාල පිළිතුර,
   i. A H I   ii. B H K   iii. A F L   iv. E H I

33. ගන්නොරුව සටන මෙහෙය වූ උඩරට රජු හා පෘතුගීසි හමුදා ප්‍රධානියා
   i. C C   ii. D K   iii. D L   iv. B L

agaram.lk

34. සෙනරත් රජු සමයේ උඩරට ආක්‍රමණය සිදුවූ ස්ථානය හා හමුදා ප්‍රධානියා
   i. F J   ii. G L   iii. E J   iv. E L

35. A හා B ගලපන්න

| *A* | *B* |
|---|---|
| i. හම්ප්‍රි ඩේවි | A. වාෂ්ප එන්ජිම නිපදවීම |
| ii. තෝමස් නිව්කොමන් | B. විවෘත උඳුන් ක්‍රමය හඳුන්වා දීම |
| iii. ජේම්ස් වොට් | C. විදුලි උඳුන නිපදවීම |
| | D. වාෂ්ප එන්ජිම වැඩිදියුණු කිරීම |
| | E. ආරක්ෂක ලාම්පුව නිපදවීම |

   i. A B C   ii. E A C   iii. E A D   iv. B C D

36. - පේලියට වැපිරීමේ ක්‍රමය හඳුන්වා දීම
   - වැපිරීමට අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු කිරීම
   - වැඩි ඵලදායීතාවයක් හඳුන්වා දීම
   ඉහත ක්‍රම කෘෂිකර්මයට හඳුන්වා දුන් පුද්ගලයා වූයේ,
   i. රොබට් බැක්වෙල්   ii. පෙරී මාටිනස්   iii. ජේත් රෝලට්   iv. ඒබ්‍රහම් ඩර්බි

37. A - ඉංග්‍රීසීන් විශේෂ ප්‍රකාශයක් මගින් තම බලය සවිමත් කර ගැනීම
B - විරෝධයට තුඩු දුන් බදු වර්ග ඉවත් කිරීම
C - ගොවි ජනතාවගේ ගැටළු විසඳීමට කටයුතු කිරීම
D - බුද්ධාගම සම්බන්ධයෙන් කටයුතු සැලකිලිමත් වීම
E - රදලයන්ගේ බලතල සීමා කිරීම

ඉහත කරුණු අතරින් 1848 නිදහස් සටනේ ප්‍රතිඵල වනුයේ,

i. A B E　ii. A C D　iii. C D E　iv. B C D

38. A - බුද්ධාගම රැක ගැනීම
B - අනුරාධපුරයේ පූජනීය ස්ථාන ආරක්ෂා කරගැනීමට කටයුතු කිරීම

ඉහත සිද්ධීන්ට අදාල පුද්ගලයන් වන්නේ,

i. අනගාරික ධර්මපාල තුමා, හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා
ii. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා
iii. අනගාරික ධර්මපාල තුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා
iv. අනගාරික ධර්මපාල තුමා, පියදාස සිරිසේන මහතා

39. - පරම විඥානාර්ථ සමාගම
- බෞද්ධ පාසල් පිහිටුවීම
- වෙසක් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස නම් කිරීම

ඉහත කරුණු වලට මූලික වූයේ,

i. අනගාරික ධර්මපාල තුමා　ii. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා
iii. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි　iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

40. ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයට අදාල පුද්ගලයෙකු නොවන්නේ,

i. ඔබාබි පාෂා　ii. සිද්දි ලෙබ්බේ
iii. ආරුමුග නාවලර් තුමා　iv. ටී.බී. ජයා මයා

agaram.lk

## II කොටස

- **I** කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසේ ප්‍රශ්න හතරකට ද **III** කොටසේ එක් ප්‍රශ්නයකටද පිළිතුරු සපයන්න
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි

## I කොටස

1. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමේ ද ලකුණු කර නම් කරන්න.

(i) ගල්හ නදිය, ඌරාතොට, මිනිහාගල් කන්ද, මහියංගනය, පොළොන්නරුව, යාපහුව, පරාක්‍රම සමුද්‍රය, කෝට්ටෙ, කොළඹ, බණ්ඩාරවෙල

(ii) රෝමය, බතාවිය, පාන්ඩ්‍ය දේශය, බුරුමය, කොන්ස්තන්තිනෝපලය, අරාබිය

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියන්න

A – ලංකාවේ අවසාන ලන්දේසි ආණ්ඩුකාරවරයා
B – බදුලු ටැම් ලිපිය පිහිට වූ රජතුමා
C – දේවපතිරාජවරයා ලවා ආර්ථික, ආගමික හා අධ්‍යාපනික අංශවල දියුණුවක් ඇති කළ රජු
D – 1803 දී උඩරට ආක්‍රමණයකළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

(ii) දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

agaram.lk



A. මෙතුමා කවුද?
B. මොහු නියෝජනය කල දේශපාලන පක්ෂය කුමක්ද?
C. මොහු 56 මැතිවරණයට ගොඩනැගූ බලවේගය කුමක්ද?
D. මෙතුමාගේ සමයේදී අහෝසි කළ බ්‍රිතාන්‍ය ගිවිසුම කුමක්ද?



A. මෙය කුමක්ද?
B. මේවා නිර්මාණය කර ඇත්තේ කුමන ස්ථානයේද?
C. මේවා අයත් වන්නේ කුමන යුගයකටද?
D. මේවා හි තැම්පත් කරන ලද්දේ කවුරුන්ද?

## II කොටස

2. (i) ශ්‍රී ලංකාව පිළිබඳව තොරතුරු ඇතුළත් දකුණු ඉන්දියාවේදී රචනා කරන ලද දෙමළ ග්‍රන්ථ තුනක් නම් කරන්න.
(ii) ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන 04 ක් දක්වන්න.
(iii) ඉතිහාසය මූලාශ්‍රයක් ලෙස පුරා විද්‍යාත්මක මූලාශ්‍රවල ඇති වැදගත්කම උදාහරණ 02 ක් ඇසුරින් පහදන්න.
(iv) පූර්ව ඓතිහාසික යුගයේ ලක්ෂණ 03 ක් උදාහරණ සහිතව පහදන්න.

3. (i) මෙරටට පැමිණි වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ කතුවරයන් තිදෙනෙක් නම් කරන්න.
(ii) A – ආරාම පාලනය පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
B – සමකාලීන වෙළඳාම පිළිබඳ තොරතුරු සඳහන් වෙයි.
C – උප රජුන් හා ප්‍රාදේශීය රජුන් පිළිබඳ තොරතුරු සඳහන් වෙයි.
D – අධිකරණයෙන් ලබාගත් ආදායම ප්‍රදේශයේ විහාරයකට පූජා කිරීම
ඉහත සඳහන් විස්තර ඇතුළත් වන සෙල්ලිපි වරහන් තුළින් තෝරා අනුපිළිවෙලින් ලියන්න.
(කළුදිය පොකුණ, කදුරු වැව සෙල්ලිපිය, ගොඩවාය සෙල්ලිපිය, බදුලු ටැම් ලිපිය, පෙරිමියන්කුලම සෙල්ලිපිය)
(iii) මෙරට මුල් වරට ඒක්සත් කළ පාලකයා ලෙස දුටුගැමුණු රජු සැළකේ. උදාහරණ 02 ක් යටතේ දක්වන්න.
(iv) මහා විජයබාහු යුගය වැදගත් වීමට බලපෑ හේතු කරුණු 03 ක් ඇසුරින් ලියන්න.

4. (i) පහත දැක්වෙන සෙල්ලිපි වැදගත් වන්නේ ඇයි?
A. මණ්ඩලගම සෙල්ලිපිය
B. තෝනිගල සෙල් ලිපිය
C. වෙහෙරකම සෙල්ලිපිය
(ii) පහත දැක්වෙන පදයන්හි අරුත දක්වන්න
A. වෙජ්ජ සාලා B. පසවන්ති සාලා C. උපසග්ග රෝග නාසා D. සොත්ථි සාලා
(iii) අතීත කර්මාන්ත සංවිධානය වූ ආකාරය උදාහරණ 02 ක් සහිතව පහදන්න
(iv) අතීත සමාජයේ දේශීය වෙළඳාම සිදුවූ ආකාරය පිළිබඳ උදාහරණ 03 ක් ඇසුරින් පහදන්න

agaram.lk

5. (i) පහත දැක්වෙන ඒකක කුමක් සඳහා භාවිතා කරන ලද්දක්ද?
A. අමුණ B. ගව්ව C. හවජර
(ii) පහත දැක්වෙන ගොඩනැගිලි කිනම් ආගම් නියෝජනය වීද?
A. පණ්නසාලා B. සිවිකශාලා
(iii) අතීත ජන සමාජයේ කාන්තා නියෝජනය හා ඔවුන්ගේ පසුබිම උදාහරණ 02 ක් සහිතව පහදන්න
(iv) කෝට්ටේ රාජ සමයේ විශිෂ්ඨතම පාලකයෙකු ලෙස 06 වෙනි පරාක්‍රමබාහු රජතුමා සැලකේ. කරුණු 03 ක් යටතේ පහදන්න.

6. (i) මෙරට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ජාතිකයන් තිදෙනා නම් කරන්න.
(ii) ඉංග්‍රීසීන් ත්‍රිකුණාමල වරාය කෙරෙහි උනන්දුවක් දැක්වීමට බලපෑ හේතු දෙකක් දක්වන්න.
(iii) 1818 පළමු නිදහස් සටන පරාජය වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පහදන්න
(iv) 1848 දෙවන නිදහස් සටන පරාජය වීමට බලපෑ හේතු දෙකක් දක්වන්න

7. (i) බ්‍රිතාන්‍ය සමයේ මෙරට ක්‍රියාමත්ක වූ මිෂනාරි ව්‍යාපාර 03 ක් නම් කරන්න
(ii) මිෂනාරි ව්‍යාපාර ආගම පැතිරවීම සඳහා අනුගමනය කරන ලද ප්‍රධාන උපාය මාර්ග 02 ක් දක්වන්න.
(iii) මෙරට බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 03 ක් පැහැදිලි කරන්න.
(iv) හින්දු හා ඉස්ලාම් පුනරුද ව්‍යාපාරයේ කැපී පෙනෙන ලක්ෂණ 02 බැගින් පහදන්න.

## III කොටස

8. (i) පහත සඳහන් නිර්මාණවල නිර්මාණකරුවන් නම් කරන්න.

    A. මොනාලිසා    B. ඇතැන්ස් හි පාසල    C. අවසාන විනිශ්චය

   (ii) පුනරුද චිත්‍ර කලාවේ දැකිය හැකි ලක්ෂණ 04 ක් ලියන්න

   (iii) පුනරුදයේ විද්‍යාත්මක දියුණුව උදාහැණ 02 ක් ඇසුරින් පහදන්න

   (iv) යුරෝපා පුනරුද ව්‍යාපාරය ලංකාවට කළ බලපෑම උදාහරණ 03 ක් යටතේ පහදන්න

9. (i) 19 වන සියවස වන විට කාර්මීකරණය වෙනත් රටවල ව්‍යාප්ත වීමට බලපෑ හේතු 03 ක් ලියන්න

   (ii) ගල්අඟුරු කර්මාන්තය නිසා දියුණු වූ අතුරු කර්මාන්ත 04 ක් දක්වන්න

   (iii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයේ ඇති වීමට බලපෑ හේතු 02 ක් කෙටියෙන් පහදන්න

   (iv) කාර්මික විප්ලවය නිසා ඇති වූ අයහපත් බලපෑම් 03 ක් කෙටියෙන් දක්වන්න

agaram.lk